**මහනුවර මහා නගර සභාව**

මහනුවර මහා නගර සභාවේ නාගරික ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා ව්‍යාපෘති සහයකවරයෙකු බඳවා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත නාගරික ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා ව්‍යාපෘති සහායකවරයෙකු බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි තනතුරු නාමය සඳහන් කර 2026.07.24 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 01

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

3. මාසික වැටුප : රු. 25,000

4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් : ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සවත්වීම (සාමාන්‍ය පොදු ඉංග්‍රීසි හැර)

සහ

පරිගණක භාවිතය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. (පරිගණක දැනුම ලබා ගැනීමට අදාළ සහතික ඉදිරිපත් කළ යුතුය.)

සහ

සිංහල, ඉංග්‍රීසි භාෂා දැනුම තිබිය යුතුය.

සහ

ක්‍රීඩා කටයුතු හා සම්බන්ධ ආයතනයක සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

5. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගනු ලැබේ.

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන ව්‍යාපෘති සහායක පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. ගෘහස්ත ක්‍රීඩාගාරය රජයේ නිවාඩු දිනයන්හි හැර අනෙකුත් සියලු දිනයන්හි පෙ. ව. 6.00 සිට ප.ව. 10.00 දක්වා ක්‍රියාත්මක වන අතර සේවා මුර ක්‍රමයකට සේවකයින් යෙදවීම සිදු කරනු ලබයි. උදෑසන සේවා මුරය පෙ.ව. 6.00 සිට ප. ව. 2.00 දක්වාත් සවස සේවා මුරය ප. ව. 2.00 සිට ප. ව. 10.00 දක්වාත් ක්‍රියාත්මක වේ. සේවා අවශ්‍යතාවය මත මෙම සේවා මුර 2න් කවර සේවා මුරයක හෝ සේවයේ යෙදීමට හැකිවිය යුතුය.

2. දිනකට අවම පැය 08 ක කාලයක්සේවාව සැපයිය යුතුය. මාසික දීමනාව ලබා ගැනීම සඳහා අවම වශයෙන් දින 21 ක් වැඩ කළ යුතුය.

3. තමා සේවයේ යෙදෙන සේවා මුරය තුළ පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.

4. සේවයේ අවශ්‍යතාවය මත ඇතැම් අවස්ථාවන්හි සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි සේවය සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හිදී උක්ත දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කළ යුතු වේ.

5. සේවා සැපයීමට අදාළ අවු. 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

6. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු මහනුවර නගර සීමාව තුළ පදිංචිකරුවකු විය යුතුය.
- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

*සටහන* :- මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ජූලි මස 10 වැනි දින.